## 34 – ලොව මුදනා ලෙස

ලොව මුදනා ලෙස දිවිපිදු කුමරුගේ කුරුසිය පාමුල
වැඩලුන් දෙව් මව්නේ
එම දිව් යාගය දැන් ඔබ සමගින පුදනට අපහට
ලැබ දෙනු දෙව් සරණේ

මම දෙවියන්වහන්සේගේ පූජාසනය වෙතට යන්නෙමි
මා ප්‍රීතිමත් කරන දෙවියන්වහන්සේ වෙතට යන්නෙමි

දෙවියනි / ඔබගේ විනිශ්වයේදී මා නිදහස් කළ මැනව
අධර්මිෂ්ඨයන්ගෙන් මා වෙන්කර / මා මුදා ගත මැනව

දෙවියනි / ඔබවහන්සේ මාගෙ ශක්තිය වනසේක
එහෙයින් සතුරාගෙන් මා රැකගත මැනව

දෙවියනි / ඔබවහන්සේගේ ගෘයයට ඇතුළුවන්ට හැකිවන
පිණිස
ඔබවහන්සේගේ සත්‍යයේ ආලෝකය මට දුන මැනව